ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021-11-12

පැමිණිලි පාර්ශවය : එන්.ජී.එස්.එම් රත්නායක මයා,
නො - 25, ආනන්දාරාම පාර,
මොරටුමුල්ල, මොරටුව.

වගඋත්තර පාර්ශවය : 01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මොරටුමුල්ල.

02. ස්ථානාධිපති,
අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
මොරටුමුල්ල.

03. පො.සැ 31852 එන්.ජේ.ටී ප්‍රනාන්දු මයා,
පොලිස් ස්ථානය,
මොරටුමුල්ල.

04. පො.කො 84599 එස්. බණ්ඩාර සමරකෝන් මයා,
පොලිස් ස්ථානය,
මොරටුමුල්ල.

පැමිණිලි අංකය : **HRC/715/15**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, පාරක සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලක් හේතුවෙන් තමා සමඟ අමනාප වූ පුද්ගලයෙකු කරනු ලැබූ ව්‍යාජ පැමිණිල්ලක් මත විමර්ශනයකින් තොරව චෝදනා කියාදීමකින්ද තොරව 2015.02.01දින තමාව අත්අඩංගුවට ගත් බවයි. මෙලෙස නිසි විමර්ශනයකින් තොරව තමාව අත්අඩංගුවට ගැනීම තුළින් බලවත් අසාධාරණයක් සිදුවූ බවත් ඒ සම්බන්ධව සාධාරණයක් ඉටුකරදෙන ලෙසත් ඉල්ලා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශවය විසින් පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2015.02.01 වන දින 139/2/සි පිළියන්දල පාර, කටුබැද්ද ලිපිනයේ පදිංචි ලලිත් කැළුම් පෙරේරා යන අයගේ නිවසේ බඩු කඩා දැමීමක් සම්බන්ධව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයකින් පසුව මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

ගල්කිස්ස පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන මෙම පැමිණිලිකරු 2015.02.01 වන දින පැය 13.30 ට පමණ පාරක ආරවුලක් සම්බන්ධව මොරටුමුල්ල පොලිස් ස්ථානය වෙත CIB 258/07 යටතේ පැමිණිල්ලක් කර ඇත. එම පැමිණිල්ල විභාග කිරීමට ප්‍රථම එදිනම පැය 21.40 ට පමණ බැණ මරණ තර්ජණය කිරීමක් සම්බන්ධව අංක CIB II 115/09 යටතේ තවත් පැමිණිල්ලක් ගොනුකර ඇත.

මොරටුමුල්ල පොලිස් ස්ථානයේ ලේඛන අනුව 2015.02.02 වන දින අළුයම අංක CIB II 128/21 යටතේ අංක 139/2/සී පංසල පාර, කටුබැද්ද, මොරටුව ලිපිනයේ පදිංචි ලලිත් කැළුම් පෙරේරා යන අයට එරෙහිව පැමිණිලිකරුගේ බිරිඳ විසින් පැමිණිල්ලක් ගොනුකර ඇත.

එම පැමිණිලි වලට අදාළ වගඋත්තරකරුවන් කැඳවීමට කටයුතු කර ඇති නමුත්, වගඋත්තරකරු ඊලඟ දින පැමිනෙන බව ඇති නමුත් ස්ථානාධිපති ඒ පිළිබඳව පසු විපරමක් කර නැති බව සහකාර පොලිස් අධිකාරිතුමා කරුණු දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු විසින් යොමු කල පැමිණිලි සම්බන්ධව කිසිදු විමර්ශනයක් නොකල ද, වගඋත්තරකරු විසින් කල පැමිණිල්ල සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙහිදී පැහැදිලිව අනාවරණය වන්නේ, මෙම පැමිණිලි පාර්ශවය විසින් ගොනු කර ඇති පැමිණිලි දෙකම (බිරිඳ විසින් කරන ලද පැමිණිල්ල) විභාග නොකර ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ලලිත් පෙරේරා යන අය විසින් කරනු ලැබූ පැමිණිල්ලට ක්ෂණිකව ක්‍රියාමාර්ග ගෙන ඇති බවයි. තවද පැමිණිලිකරුගේ පැමිණිලි සඳහා නිසි විමර්ශනයක් සිදුව තිබෙන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා වෙත පැමිණිලි කිරීමෙන් පසුව බවද කරුණු අනාවරණය වේ. ඒ අනුව මොරටුමුල්ල පොලිස් ස්ථානාධිපති පො.ප චමින්ද පින්තු යන අය හා අදාළ අනෙකුත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට අසාධාරණයක් කළ බවට අනාවරණය වන අතර, එය 2015.06.11 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී අනාවරණය වූ පසුව වැඩිදුර වාර්තාවක් මඟින් නිවැරදි කරන බවට වගඋත්තරකරුවන් පොරොන්දු වීමෙන් දෙපාර්ශවය අතර සමථයක් ඇති වී ඇත. නමුත් එම සමථයද ක්‍රියාත්මක නොවීමෙන් පැමිණිලි පාර්ශවය තව තවත් අගතියට පත්ව ඇත.

ඒ අනුව පැමිණිලිකරුවන් විසින් යොමු කල පැමිණිලි සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ.

ඒ සම්බන්ධයෙන් කළුතර II සහකාර පොලිස් අධිකාරීවරයා විසින් 2019.11.29 වන දිනැතිව අංක ASP II/1519/2019 යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවෙන්ද පැහැදිලි වේ. එම වාර්තාවට අනුව, "මෙම පැමිණිලිකරුගේ දෙවන පැමිණිල්ල වන මරණ තර්ජණය කිරීම සම්බන්ධයෙන් සාක්ෂි සහිතව කරන ලද පැමිණිල්ල හා 03 වන පැමිණිල්ල වන බැණ පහරදීමට තැත් කිරීමට සඳහන් වන වන පැමිණිල්ල මෙම පැමිණිලිකරු විසින් ජොෂ්ඨ පොලිස් අධිකාරී වෙත පැමිණිලි කිරීමේ දිනය දක්වා විමර්ශනයක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය වන ලදී. තවද මෙම පැමිණිල්ල මධු සුභාෂ් රත්නායක විසින් මොරටුමුල්ල පොලිස් ස්ථානයේ කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් අවධානය යොමුකර එය එකම පුද්ගලයෙක් වටා ගෙතුන පැමිණිලි හෙයින් මෙම පැමිණිලි වලට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළේ නම් අවසන් වරට මධු සුභාෂ් රත්නායක යන අයට එරෙහිව බලඅපරාධයක් වළක්වා ගැනීමට හැකියාව ඇති වනවා විය හැක. මේ අනුව ස්ථානාධිපති, මොරටුමුල්ල විසින් සිදුකළ රාජකාරී පැහැරහැරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු අනුව ස්ථානාධිපති, මොරටුමුල්ල වෙත අවවාද කිරීම සුදුසු බවට නිර්දේශ කරමින් ජොෂ්ඨ පොලිස් අධිකාරීවරයා වෙත 2015.03.03 දිනැතිව වාර්තාව යොමු කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මෙම කරුණු අනුව ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටින පරිදි උක්ත වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. ඒ අනුව වගඋත්තරකාර ස්ථානාධිපති විසින් පුද්ගලිකවත් අනෙකුත් නිලධාරීන් සාමූහිකවත් ඒ සඳහා වගකිවයුතු වන අතර, ඒ අනුව 01 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 5,000/- ක මුදලක්ද, සෙසු වගඋත්තරකරුවන් විසින් රු. 3,000/- ක මුදලක්ද පැමිණිලිකරු වෙත ගෙවීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා සහ මෙම නිර්දේශය නියමිත වගඋත්තරකරුවන්ගේ වර්ථමාන සේවා ස්ථානයන් වෙත යොමු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ අධ්‍යක්ෂ (නීති), පොලිස් නීති කොට්ඨාශය වෙතද යොමු කරනු ලැබේ.

2021 .12 . 31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු

නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මහා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති),
පොලිස් නීති කොට්ඨාශය,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

} ඉහත 02 නිර්දේශය අනුව කටයුතු කිරීමට

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/